# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2007 අංක 27 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 ජූලි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ
II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු 5.00 යි

## 2007 අංක 27 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 18 වන දින]

එල්.ඩී.— ඕ.12/2007

### 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක 27 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ ( සංශෝධන ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 12 වන වගන්තියේ (3) උපවගන්තියෙහි, "සහ 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද සමාජ ආරක්ෂණ මණ්ඩලය", යන වචන වෙනුවට "1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත මගින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ . — 2000 අංක 43 දරන පනතේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (1) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1අ) ප්‍රතිරක්ෂණය කිරීම කරනු ලබන සෑම රක්ෂණකරුවකු විසින් ම ප්‍රතිරක්ෂණය කිරීමට අපේක්ෂා කරනු ලබන වගකීමෙන්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සියයට පනහකට වැඩි නොවන ප්‍රතිශතයක්, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත මගින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත, එම රක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කළ යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.".

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.